# කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය

# වී අලෙවි මණ්ඩලය

## තනතුරු පුරප්පාඩු

වී අලෙවි මණ්ඩලයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පරිපාලන), නීති නිලධාරී/ අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්, ගණකාධිකාරී, සහකාර ගණකාධිකාරී තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා පහත සඳහන් සුදුසුකම් සපුරාලන ලද අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පරිපාලන) (HM 1-1) තනතුරු 01

**(අ) බාහිර අයදුම්කරුවන් බඳවා ගැනීම**

**සුදුසුකම් (පහත 1 හෝ 2 )**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් කළමනාකරණ, රාජ්‍ය ව්‍යාපාර හෝ රාජ්‍ය පරිපාලන, වාණිජවේදී, ආර්ථික විද්‍යා උපාධියක් ලබා තිබීම **සමග**

   අදාළ ක්ෂේත්‍රයකින් පශ්චාත් උපාධියක් ලබා තිබීම තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයට ගැළපෙන්නා වූ, පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය ලබා තිබීම **සහ**

   රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක "කළමනාකාර" මට්ටමේ තනතුරක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර පහළොවක (15) ක පළපුරුද්දක් ලබා තිබීම.

2. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයට ගැළපෙන්නා වූ පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක පූර්ණ සාමාජිකත්වය ලබා තිබීම **සහ**

   රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක "කළමනාකාර" මට්ටමේ තනතුරක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර පහළොවක (15) ක පළපුරුද්දක් ලබා තිබීම **හෝ**

   ශ්‍රී ලංකා පරිපාලන සේවයේ පළමු පන්තියේ නිලධාරියකු වීම.

**(ආ) අභ්‍යන්තර අයදුම්කරුවන් බඳවා ගැනීම**

**සුදුසුකම්**

1. බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම. **හෝ**
2. "කළමනාකාර" (MM ) සේවා ගණයෙහි 1 වන ශ්‍රේණියෙහි තනතුරක අවම වශයෙන් වසර පහ (05) ක අදාළ විෂය ක්ෂේත්‍රයෙහි සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**අනිවාර්ය සුදුසුකම්**

සුදුසුකම් ලැබීම සඳහා වන සේවා කාලය තුළ සියලුම වැටුප් වර්ධක නියමිත දිනට උපයාගෙන තිබිය යුතු වන අතර, එම කාලය තුළ විනයානුකූල දඬුවම් ලබා නොතිබිය යුතුය.

**(ඇ) වැටුප් ක්‍රමය**

HM 1-1-2025-රු. (140,640-15 X 4,100 - 202,140)

(2025.03.25 දිනැති 1/2025 අංක දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය අනුව)

**(ඈ) වයස් සීමාව**

අවුරුදු 35 ට නොඅඩු හා අවුරුදු 55 ට නොවැඩි විය යුතුයි. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව බලනොපසයි.

**(ඉ) වෙනත් සුදුසුකම්**

**සෑම ඉල්ලුම් කරුවෙක්ම,**

i. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුයි.
ii. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.
iii. විශිෂ්ට චරිතයෙන් යුක්ත විය යුතුය.

## නීති නිලධාරී/ අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් - (MM 1-1)- තනතුරු 01

**(අ) සුදුසුකම්**

- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් නීතිවේදී උපාධියක් සහිත ශ්‍රී ලංකා නීති විද්‍යාලය මගින් පිරිනමනු ලබන නීතිවේදී පාඨමාලාව හදාරා ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයෙකු ලෙස දිවුරුම් දී ඇති අයෙකු වීම **සමග**
- රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ වසර දෙක (02) හෝ පළපුරුද්ද සහිත වීම.
- වෘත්තීය නීතිවේදියකු වශයෙන් වසර තුන (03) ක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**සටහන:**

ඉංග්‍රීසි භාෂාව සම්බන්ධව මනා පරිචය සහ පරිගණක භාවිතය පිළිබඳ ප්‍රවීණතාවය කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

**(ආ) වැටුප් ක්‍රමය**

MM 1-1-2025 - රු. (91,690 -10X2,480 -15X3,450 - 168,240)

(2025.03.25 දිනැති 1/2025 අංක දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය අනුව)

**(ඇ) වයස් සීමාව**

අවුරුදු 25 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුයි. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව බලනොපායි.

## ගණකාධිකාරී - (MM 1- 1)- තනතුරු 01

**(අ) සුදුසුකම්**

- ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ ( ICASL) අන්තර් මධ්‍යම පරීක්ෂණයෙන් සමත් වීම **හෝ**
- එක්සත් රාජධානියේ වරලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ (CIMA) අන්තර් මධ්‍ය පරීක්ෂණය සමත් වීම **හෝ**
- එක්සත් රාජධානියේ වරලත් සහතිකලත් ගණකාධිකාරීන්ගේ සංගමයේ (ACCA) අන්තර් මධ්‍යම පරීක්ෂණය සමත් වීම **හෝ**
- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් කළමනාකරණය හෝ වානිජවේදී උපාධිය **හෝ**

  උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමාව **සමඟ**
- රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක ගිණුම් හා මූල්‍ය කටයුතු පිළිබඳව වර්ෂ තුන ( 03 ) කට නොඅඩු සේවා පළපුරුද්දක් තිබීම.

**සටහන**

ඉංග්‍රීසි භාෂාව පිළිබඳ මනා පරිචය සහ පරිගණක භාවිතය පිළිබඳ ප්‍රවීණතාවය, පරිපාලනය, කළමනාකරණය, අලෙවි ප්‍රවර්ධනය හා ප්‍රචාරණය යන විෂයන් සම්බන්ධයෙන් වන දැනුම කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

**(ආ) වැටුප් ක්‍රමය**

MM 1-1-2025 - රු. (91,690 -10 X 2,480 -15 X 3,450 - 168,240)

(2025.03.25 දිනැති 1/2025 අංක දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය අනුව)

**(ඇ) වයස් සීමාව**

අවුරුදු 25 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි අය විය යුතුයි. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව බලනොපායි.

## සහකාර ගණකාධිකාරී - (JM 1-1) - තනතුරු 02

**(අ) බාහිර අයදුම්කරුවන් බඳවා ගැනීම**

**සුදුසුකම් (පහත 1 හෝ 2)**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ගිණුම්කරණය විෂය සහිතව කළමනාකරණ හෝ වාණිජ්‍ය යන විෂය ක්ෂේත්‍රයකින් ලබාගත් ප්‍රථම උපාධිය සමග උපාධි සුදුසුකම් ලැබීමෙන් පසු රජයේ දෙපාර්තමේන්තු, සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩල හෝ පිළිගත් වාණිජ ආයතනයක එක් අවුරුදු පළපුරුද්ද.
2. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයට ගැළපෙන්න වූ පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක අන්තර් මධ්‍ය පරීක්ෂණය සමත් වීම සමග අදාළ විෂය ක්ෂේත්‍රයේ එක් අවුරුද්දක පළපුරුද්දක් ලබා තිබීම.

**(ආ) අභ්‍යන්තර අයදුම්කරුවන් බඳවා ගැනීම**

**සුදුසුකම් (පහත 1 හෝ 2)**

1. අදාළ ක්ෂේත්‍රයේ තනතුරක ගිණුම් සහකාර ගණයේ හෝ කළමනාකරණ සහකාර ගිණුම් කටයුතුවලට අදාළව දෙවන ශ්‍රේණියේ වසර පහ (05) ක පළපුරුද්ද.
2. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

**(ඇ) වැටුප් ක්‍රමය**

JM 1-1-2025 රු. (72,650 -10 X 1,360 -18 X 2,040 -122,970)

(2025.03.25 දිනැති 1/2025 අංක දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය අනුව)

**(ඈ) වයස් සීමාව**

අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි අය විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව බල නොපායි.

**පොදු කරුණු**

- මෙම තනතුරු ස්ථිර තනතුරු වේ. සේවක අර්ථසාධක අරමුදලට හා සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදල් සඳහා හිමිකම් සහිතය.
- අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට තනතුරට ඉල්ලුම් කිරීම පිණිස අවශ්‍ය සුදුසුකම් සෑම ආකාරයකින්ම සපුරා තිබිය යුතුය.
- දැනට රාජ්‍ය ආයතනවල සේවයේ නියුක්ත අයදුම්කරුවන් ආයතනයේ ප්‍රධානියා මගින් අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.
- ජීව දත්ත තොරතුරු ඇතුළත් තමා විසින් සකස් කරන ලද අයදුම්පතක් අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් තහවුරු කරන ලද ලේඛනවල සහතික කරන ලද පිටපත් සහිතව ඥාතීන් නොවන දෙදෙනෙකුගේ තොරතුරුද ඇතුළත්ව 2025.11.03 දිනට පෙර ලියාපදිංචි තැපෑලෙන් පහත සඳහන් ලිපිනයට යොමු කිරීමට කටයුතු කළ යුතුය.
- අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ලිපි කවරයේ වම් පස ඉහළ කෙළවරෙහි ඉල්ලුම් කරන තනතුරු නාමය සඳහන් කළ යුතුය.
- ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක හා/ හෝ ලිඛිත කරන විභාගයක ප්‍රතිඵල මත බඳවා ගැනීම් සිදු කෙරේ.
- පත්වීම් සම්බන්ධයෙන් බලපෑම් කිරීම/ සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කිරීම නුසුදුස්සෙකු වීමට හේතුවේ.
- පත්වීම් සම්බන්ධයෙන් අවසාන තීරණය වී අලෙවි මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලය සතු වේ.

**සභාපති, වී අලෙවි මණ්ඩලය,**
**නිවාස මහ ලේකම් ගොඩනැගිල්ල,**
**6 වන මහල, සර් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත,**
**කොළඹ 02.**